වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

2022







මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

மாணிக்கம் மற்றும் ஆபரண ஆராய்ச்சி மற்றும் பயிற்றுவிப்பு நிறுவனம்

Gem and Jewellery Research and Training Institute

GJRTI

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ

හා

අභ්‍යාස ආයතනය

වාර්ෂික වාර්තාව

2023

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා
අභ්‍යාස ආයතනය
“රුවන් සෙවන”
නො:73/5/A,
වැලිවිට
2024.02.27

ගරු අමාත්‍යතුමා
කර්මාන්ත අමාත්‍යාංශය
තැ.පෙ 570,
73/1
ගාලු පාර,
කොළඹ-03

ගරු අමාත්‍යතුමනි,

<u>වාර්ෂික වාර්තාව 2023</u>

1971 අංක (2) 14 38 උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2023වර්ෂය සඳහා වූ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තා
2. 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධන වාර්තාව.

මෙයට විශ්වාසි

ඒ.එම්. රත්නායක
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

දැක්ම මෙහෙවර හා අභිමතාර්ථ

දැක්ම

“ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම”

මෙහෙවර

“ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉහා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පිය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි ”

අභිමතාර්ථ

“ ශ්‍රී ලංකාවේ මැණික් බනිජ සම්පත් විභව ප්‍රදේශ ගවේෂණය කර නිරසාර ලෙස නෙලා ගැනීම සහ නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිත ශ්‍රමිකයන් තුලින් ජාතික ආර්ථිකයට දායක වීම”

2.1. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

2023 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය.

01	ඒ.එම්. රත්නායක මයා	සභාපති මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය	අධ්‍යක්ෂ මණ්ඩල සභාපති 2022.06.27 දින සිට මේ දක්වා
02	කේ.එන්.පී. ජයරත්න මයා	අධ්‍යක්ෂ (වැ.බ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.04.01 සිට මේ දක්වා
03	එස්.ජී.එල්. ප්‍රනාන්දු මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.12.08 සිට මේ දක්වා
04	රවිරාජසිංහ සංජීපන් මයා	සභාපති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2023.01.11 සිට 2023.11.15 දක්වා
05	සංජේ පෙරේරා මයා	සභාපති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2023.12.15 සිට මේ දක්වා
06	ජනක උදයකුමාර මයා	අධ්‍යක්ෂ ජනරාල් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2023.12.28 සිට මේ දක්වා
07	එස්.ඒ.ඩබ්.කේ. ජයසේකර මයා	අධ්‍යක්ෂ (සැලසුම්) වැ.බ කර්මාන්ත අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක (අමාත්‍යාංශ නියෝජිත) 2022.01.31 සිට මේ දක්වා

ඉහළ කළමණාකාරීත්වය



ඒ.එම්. රත්නායක මහතා

සභාපති

(2022.06.27 දින සිට)



බී.ජී.ආර්.ඩබ්. ගම්ලත් මහතා

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

MSC (Gem),B.Sc (SP) (Physics) FGA, MGA (SL),MBA(Reading)



බී.ජී.ආර්.ඩබ්. ගම්ලත් මහතා

අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)

MSC (Gem),B.Sc (SP) (Physics) FGA, MGA (SL),MBA(Reading)



ආර්.එම්.එන්.පී.කේ ජයසිංහ මහතා

අධ්‍යක්ෂ(පර්යේෂණ) වැ.බ

M.Phil(Gem.),M.Sc(GIS & RS),B.Sc. (Geology),MIGSL,MGSSL,MGASL



එස්.එල්.පේ. මුහන්දිරම් මහතා

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

MPAcc(USJP),B.com (SP)Accountancy 2nd lower Hons (USJP),CBA(ICASL),ADV.Cer (Procurment)(ICTAD



ඩබ්.එල්. ප්‍රසංගිකා සුරේන්ද්‍ර මිය

සහකාර අධ්‍යක්ෂ
(පරිපාලන හා මානව සම්පත්)

B.des,Jew(Sp)(UOM)

3. සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය

3.1 අවස්ථා

❖ පර්යේෂණ හා පුහුණුව සඳහා වන ඉල්ලුම

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ පුහුණු හා පර්යේෂණ කාර්යයන්හි සංවර්ධනය හා නියාමනය සඳහා පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය විසින් මේ වන විට මැණික් පතල් කැණීමේ සිට ජාත්‍යන්තර වෙළඳපොළ දක්වා ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම දක්වා අගය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය ආවරණය වන අයුරින් නව නිර්මාණකරණයට අවශ්‍ය කුසලතා හා දැනුම ලබා දීම උදෙසා පුහුණු හා පර්යේෂණ වැඩසටහන් දියත්කිරීමේ කාර්යයයේ නියලි සිටියි. ආයතනය විසින් මේ වන විටත් සහතික පත්‍ර මට්මේ සිට ඩිප්ලෝමා මට්ටම දක්වා වූ විවිධ ක්ෂේත්‍ර ගණණාවක් ආවරණය වන අයුරින් පුහුණු පාඨමාලා 21 කට ආසන්න සංඛ්‍යාවක් මධ්‍යස්ථාන 15 ක් හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ආයතනය බිහිවි දශක තුනකට ආසන්න කාලයක් තුල මෙම ආයතනයට අභියෝගයක් විය හැකි මට්ටමේ වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික පුහුණු ආයතන බිහිවි නොමැති අතර ආයතනයට අභියෝගයක් විය හැකි මට්ටමේ පුහුණු ආයතන බිහිවිමේ ප්‍රවණතාවයක් ද වෙළඳපොළ තුල දක්නට නොලැබෙන බව හඳුනාගෙන ඇත. මේ අනුව තවදුරටත් මෙරට හා ජාත්‍යන්තර මැණික් වෙළඳපොළ සඳහා අනිකුත් රටවල් සමඟ තරගකල හැකි මට්ටමේ දැනුම ව්‍යාප්ත කල හැකි නිපුණතාවය ආයතනය සතුව පවතින බවට හඳුනා ගත හැකිවේ.

❖ තාක්ෂණික පහසුකම්

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා උසස් තාක්ෂණික නිපුණතාවයකින් යුතු පුහුණු ශ්‍රමිකයින් බිහිකිරීම සඳහා මෙන්ම පරිසර හිතකාමී මැණික් ගවේෂණ පර්යේෂණ කටයුතු සඳහා මෙන්ම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල නව නිෂ්පාදන හඳුන්වා දීමට හැකියාවක් සහිත පුළුල් යන්ත්‍ර සූත්‍ර උපකරණ මෙන්ම පරිගණක මෘදුකාංග ආයතනය සතුව ඇත. එසේම මෙම යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට හැකියාවත් සහිත දැනුමකින් යුතු පුළුල් පුහුණුවක් සහිත මානව සම්පතක් ද ආයතනය සතුවේ. ජත්‍යන්තර ප්‍රමිති මට්ටමින් යුතුව පුහුණු පාඨමාලා සඳහා උපයෝගි කර ගත හැකි පුළුල් පහසුකම් වලින් සමන්විත රත්නවිද්‍යාගාර , මැණික් කැපුම් පුහුණු ඒකක , පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ කිරීමේ පුහුණු පහසුකම් ඇතුළු ත්‍රිමාණ මුද්‍රණ තාක්ෂණය , වාත්තුකිරීම හා විද්‍යුත් ලෝහාලේපන තාක්ෂණික පහසුකම් ආයතනය සතුවේ. එසේම මැණික් කර්මාන්තයට අදාල පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන X-Ray Florescence Spectrometer , Magnetic Separator , specific gravity scale , Laser Diffraction Particle size analyser , Fourier – Transform Infrared Spectroscope , Raman Spectroscope , Ultraviolet-Visible Spectroscope වැනි නවින යන්ත්‍ර උපකරණද ආයතනය සතුවේ.

❖ ආයතනික ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ අවස්ථා හා දියුණුව

පාර්ලිමේන්තු පනත මගින් මෙම ආයතනය පිහිටුවා ඇති මූලික අරමුණු වලන් ඔබ්බට ගිය සංවර්ධන ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ආයතනය සතුව පවති. වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන ඉහල ප්‍රමිති මටටමකින් යුතු සහතික පත්‍ර ප්‍රදානෝත්සවයන් පැවැත්වීම , ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු පර්යේෂණ සමුළු පැවැත්වීම ආයතනයේ විද්‍යාර්ථීන්ගේ සංගමයක් ආරම්භ කර පවත්වා ගෙන යාම වැනි අවස්ථා රාශියක් ක්‍රියාත්මක කිරීමට ආයතනයට හැකියාව පවති.

❖ කර්මාන්තයේ දියුණුව සඳහා ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ දේශිය නිරසර , පරිසර හිතකාමී හා ආචාර විද්‍යාත්මක සංවර්ධනයක් ඇති කිරීම උදෙසා ආයතන සිය ක්‍රියාකාරකම් හැකිතාක් බාහිර ආයතන සමඟ සම්බන්ධ වී ඒකාබද්ධ සංධිය

වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ඇත. මේ යටතේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, භූවිද්‍යා සමීක්ෂ හා පතල් කාර්යංශය , ජාතික විද්‍යා පදනම , කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පේරාදෙනිය , සබරගමුව සහ ඌව වෙල්ලස්ස වැනි විශ්ව විද්‍යාල මෙන්ම FGA , තායිලන්ත මැණික් ආයතනය (GTI) , පකිස්ථාන් රජය වැනි විදේශිය රාජ්‍ය හා ආයතන සමඟ ක්‍රියාත්මක වී මෙම වැඩසටහන් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර තවදුරටත් සංවර්ධිත කර්මාන්තයක් උදෙසා විවිද බාහිර පාර්ශව සමඟ සංධිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ආයතනය සතුවේ.

- ❖ ආයතනික ප්‍රචාරක වැඩසටහන්

ආයතනයේ පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් ප්‍රචාරණය හා දැනුවත් කිරීමේ කටයුතු සඳහා වඩාත් ප්‍රමුඛතාවයක් දී කටයුතු කරනු ලැබේ. මේ යටතේ වර්තමානයේ බහුල වශයෙන් ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලබන සමාජ මාධ්‍ය භාවිතා කරමින් ආයතනික වැඩසටහන් ප්‍රචාරණයට අවස්ථාව සලසා ගෙන ඇත. නමුත් මෙම කර්මාන්තයේ ස්වරූපය අනුව ඒ ඒ වයස් කාණ්ඩ , ප්‍රාදේශිය පදනම , නිරත වන වෘත්තීය හා කර්මාන්තයේ යෙදෙන්නනගේ අධ්‍යාපන මට්ටම් අනුව තවදුරටත් සාම්ප්‍රදායික දැනුවත් කිරීම හා ප්‍රචාරණ කාර්යන්හිද නිරතව සිටියි.

3.2. අභියෝග

- ❖ තාක්ෂණය ,යටිතල මූල්‍ය හා භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම.

මැණික් කර්මාන්තයට අදාල නිරන්තරව යාවත්කාලින වන තාක්ෂණික දැනුම යන්ත්‍ර සූත්‍ර කර්මාන්තයේ නවින ප්‍රවණතා සම්බන්ධයෙන් වන දැනුම මෙරට කර්මාන්තරුවන්ට යොමුවීමේ පසුගාමී තත්ත්වයක් දක්නට ලැබේ. එසේම ජාත්‍යන්තර දැනුම ලබා ගැනීමට අවශ්‍ය ආකාරයේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට යොමු වීමේ අවස්ථා අඩු මට්ටමක පවති. පුහුණු පාඨමාලා සඳහා මෙන්ම පර්යේෂණ කටයුතු සඳහා නවින යන්ත්‍ර සූත්‍ර පුහුණු උපකරණ භාවිත වීමේ ප්‍රවණතාවය අඩු මට්ටමක ඇති අතර ආයතනික සංවර්ධන කාර්යේදී අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම කෙරෙහි මෙම යටිතල පහසුකම් ප්‍රමාණවත් නොමැති වීම බාධාකාරී වී ඇත. එසේම ආයතනය සඳහාම වූ ස්ථීර ගොඩනැගිලි පහසුකම් නොමැති වීම ද සංවර්ධන කාර්යෙයේදී අඩුවක්ව පවති. ආයතනයේ පුහුණු හා පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලබන පුහුණු ඒකක ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව සංවර්ධනය කල යුතු මට්ටමක පවති. එසේම රත්න විද්‍යා රසායනාගාර පර්යේෂණ රසායනාගාර සඳහා නවින යන්ත්‍ර සූත්‍ර සපයා ගත යුතු අතර මේ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගත යුතුව ඇත.

- ❖ මානව සම්පත් සංවර්ධනය මන්දගාමී වීම.

ආයතනික සේවක සැලැස්ම යටතේ අනුමක ස්ථීර සේවක සංඛ්‍යාව 136 ක් වන නමුත් මේ වන විට ආයතනය සතුව සිටිනුයේ සේවකයින් 64 ක් පමණි. මේ වන විට ආයතනයේ කටයුතු ප්‍රශස්ත හා ගුණාත්මක අයුරින් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සේවකයින් සංඛ්‍යාවක් ආයතනය සතුව නොමැති අතර ආයතනය පවත්වා ගෙන යාමට ප්‍රධාන වශයෙන්ම බලපානු ලබන තනතුරු කිහිපයකම පුරප්පාඩු පවති. එසේම අධ්‍යාපනායතනයක සිටිය යුතුම උසස් අධ්‍යාපනයක් සහිත අධ්‍යයන කාර්ය මණ්ඩල හිඟතාවයක් ද පවතින අතර අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා උපාධි මට්ටමේ පිරිසක් බඳවා ගත යුතුව ඇත. ආයතනයේ පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා මේ වන විට වඩාත් ඉහල ඉල්ලුමක් පැවතියද මානව සම්පත් හිහතාවය ආයතනික කටයුතු ප්‍රශස්ත අයුරින් කර ගෙන යාමට බාධාකාරී වී ඇති බැවින් දේශිය හා ජාත්‍යන්තර වශයෙන් වූ පුහුණු අවස්ථා සඳහා කාර්යය මණ්ඩලය යෙදවීමටත් පුරප්පාඩු සඳහා කඩිනමින් පිරිස් බඳවා ගැනීමේ කටයුතුත් සිදු කල යුතුව ඇත.

- ආයතනික කාර්යයන් ක්‍රියාක්මක කිරීමේ නෛතිකභාවය

ආයතනය ස්ථාපිත කරන ලද පනත ප්‍රකාරව ආයතනය වෙත පවරා ඇති බලතල හා ක්‍රියාකාරකම් වර්තමානය වන විට සංශෝධනයකට ලක් කල යුතු බව හඳුනා ගෙන ඇත. ආයතනික ක්‍රියාකාරකම් සිදුකිරීමේදි මෙම සීමාවන් තුල කටයුතු කිරීමට සිදුවීම හේතුවෙන් ඇතැම් ක්‍රියාකරකම් ඉටු කිරීමේ අවස්ථා මහහැරි ගොස් ඇත. ඒ අනුව ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව අධ්‍යාපනායතන නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ගත යුතුව ඇත. එසේම කර්මාන්තයට ප්‍රවිෂ්ඨ වන්නන් සඳහා ප්‍රමිතිගත අධ්‍යාපන මට්ටමක් නියම කල යුතු අතර කර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහාත් පරිසර හිතකාමී කර්මාන්තයක් උදෙසා සහ කර්මාන්තයේ නියුක්තවුවන්ගේ වෘත්තීමය භාවයක් සහිතව ආචාරධර්ම පද්ධතියකට අනුකූලව මෙම කර්මාන්තය ක්‍රියාත්මක කිරීම උදෙසාත් මෙම කර්මාන්තයට අදාල නිතිමය පසුබිම සකස් කර ගත යුතු අතර ඒ සඳහා වන නියාමන ක්‍රමවේදයක් සකස් කර ගත යුතුව ඇත.

- සම්පූර්ණ වී නොමැති අවශ්‍යතා

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ උසස් අධ්‍යාපනයක් සහිත ප්‍රවිණයින් පුහුණු හා පර්යේෂණ කාර්යයන් සඳහා තවදුරටත් සම්බන්ධකර ගැනීමේ අවශ්‍යතාවයන් පවති. එසේම කර්මාන්තයට මෙන්ම වෙළඳපොළ සඳහා ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන හඳුන්වා දීම සඳහා හා පරිසර හිතකාමී කැණීම් ක්‍රමවේද හා පර්යේෂණ අත්හදා බැලීම් සඳහා අවශ්‍ය නවින තාක්ෂණයෙන් ආයතනය සවිබල ගැන්වීම මන්දගාමී ස්වරූපයක පවතින අතර එය තිරසර හා ක්‍රමාණුකූල අයුරින් සංවර්ධනය කරගත යුතු මට්ටමක පවති.

4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

4.1. අරමුණු

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව1995 ජූලි 28 දිනැති හා අංක 882 දරණ ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවන ලදී.ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරීම, වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීමයි.

4.2. ආයතනයේ බලතල

ශ්‍රී ලංකාවේ මැණික් බණිජ හා එම නිධි පිළිබඳව සමීක්ෂණය කිරීම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

4.2.1. ශ්‍රී ලංකාවේ මැණික් බනිජ පිළිබඳ සමීක්ෂණයන් කිරීම

(අ) පිහිටීම.
(ආ) හඳුනා ගැනීම.
(ඇ) මැණික් ගල් අනර්ගීකරණය කිරීමේ ක්‍රම.
(ඈ) වෙනත් අදාල ක්ෂේත්‍රයන් හා අදාල රත්න විද්‍යාත්මක පර්යේෂණ කිරීම් .

4.2.2 පතල් කැණීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ සැදීම, මැණික් ගල් පිළිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හි මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම.

4.2.3 (අ) මැණික් කැපීම.
(ආ) ස්වරණාභරණ සෑදීම.
(ඇ) දියමන්ති ඇතුලු රත්න විද්‍යාව.
(ඈ) ස්වර්ණාභරණ මෝස්තර සකස් කිරීම.
(ඉ) මැණික් ගල් අනර්ගීකරණය
(ඊ) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වෙනත් අදාළ අංශ පිළිබඳව පුහුණුවක් ලබා දීම.

4.2.4 වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම හා අදාල මාතෘකා හා කරන ලද වැඩ කටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පල කිරීම.

4.2.5 ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම පහසු කිරීමට අවශ්‍ය වෙනත් දෑ කිරීම.





පුහුණු අංශය







5. පුහුණු අංශය

වෘත්තීය අධ්‍යාපනය රටේ නිෂ්පාදන අංශයන්හි සංවර්ධනයට හා එවැනි ආර්ථිකයක් ගොඩනංවා ගැනීම සඳහා ප්‍රභල දායකත්වයක් ලබා දෙනු ලැබේ. සාමාන්‍යපෙළින් හා උසස් පෙළින් පසු මෙරට බහුතර පිරිසකගේ අනාගතය අභිවෘර්ධිය සකසා ගත යුත්තේ වෘත්තීය අධ්‍යාපන ක්‍රමය තුලිනි. පසුගිය කාලයේදී මෙරට මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි නැඹුරුවීම වැඩි වූ අතර ඒ අනුව විශාල වශයෙන් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල වෘත්තිය පුහුණුව හා අධ්‍යාපනය ලබා ගැනීම සඳහා උනන්දුව හා ඒ සඳහා බොහෝ පිරිසකගේ යොමු වීමක් දක්නට ලැබිණි. පුහුණු අංශයට මෙම ඉල්ලුම සතුටු දායක ලෙස ඉටු කිරීමේ හැකියාව පැවති අතර ඒ තුලින් කර්මාන්තයේ සංවර්ධනය සඳහා කටයුතු කල හැකි වෘත්තීයවේදීන් බිහිකිරීමට ආයතනයෙහි වෘත්තීය අධ්‍යාපන පාඨමාලා තුලින් හැකිවී ඇත.
මෙම වෘත්තිය අධ්‍යාපන ක්‍රියාවලිය තුල ජාත්‍යන්තරය සමග තරගකල හැකි කුසලතාවලින් හෙබි විද්වත් ශ්‍රමබලකායක් මෙම කර්මාන්තය ආශ්‍රිතව බිහි කිරීම සඳහා පුහුණු අංශය විසින් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් හේතු විය. ඒ අනුව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනයක් ඇති කිරීම ඉලක්ක කර ගත් ප්‍රධාන කාර්යයන් පහතින් සංක්ෂිප්තව වාර්තා කිරීමට කටයුතු කර ඇත.

5.1. පුහුණු පාඨමාලා නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

පුහුණු අංශය විසින් පුහුණු පාඨමාලා සහතික පත්‍ර මට්ටමේ සිට ඩිප්ලෝමා මට්ටම දක්වා සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන කාර්යයන් ලෙස විෂයමාලා සංවර්ධනය , පුහුණු ලාභීන් බඳවා ගැනීම , පුහුණු කිරීම , විභාග පැවැත්වීම කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කිරීම යන කාර්යන් මධ්‍යස්ථාන 15 ක් හරහා ක්‍රියාත්මක කිරීම සිදු විය.
තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාවේ (TVEC) ප්‍රමිති තත්ත්වයන්ට හා නිර්ණායකයන්ට අනුකූලව අංශය විසින් පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් සැළසුම් කර තිබේ. මේ යටතේ ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඇතුළු අනිකුත් ප්‍රාදේශිය මධ්‍යස්ථානයන්හි ඉහල ගුණාත්මක පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරනු ලැබේ.
ආයතනය විසින් මූලිකව ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ පුහුණු වැඩසටහන් සැළසුම්කර ක්‍රියාත්මක කරනු ලබයි.


I. ගාස්තු අයකර ක්‍රියාත්මක කරන පාඨමාලා
II. අඩු ආදායම්ලාභීන් සඳහා නොමිලයේ ක්‍රියාත්මක කරන පාඨමාලා
III. දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ ක්‍රියාත්මක පාඨමාලා

මෙම වර්ෂයේදී පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා 150 කට ආසන්න ප්‍රමාණයක් දිප ව්‍යාප්තව පිහිටුවා ඇති පුහුණු මධ්‍යස්ථාන 15 ක් හරහා ක්‍රියාත්මක කරමින් පුහුණු කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව **1577** කි. මෙම සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 57% ක වර්ධනයකි. මෙයට අමතරව කුසලතා සංවර්ධන වැඩසටහන් හා ව්‍යාවසාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් ද ආධුනිකයින් පුහුණු කර කර්මාන්තයට හඳුන්වා දීමට 2023 වසරේදී හැකියාව ලැබී ඇති අතර 2023 වසරේදී ද පුහුණු පාඨමාලා හදාර සම්පූර්ණ කර ඇති සංඛ්‍යාව **1092** ක් වන අතර 2023 වසරේ සිට 2024 දක්වා ක්‍රියාක්මක වන පාඨමාලාවන්හි තරවදුරටත් පුහුණුවේ නියුතු ශිෂ්‍ය සංඛ්‍යාව **665** ක් වේ .

5.1.1. 2023 වසරේදී ක්‍රියාත්මක කරන ලද පුහුණු පාඨමාලා සංඛ්‍යාව හා ශිෂ්‍ය බඳවා ගැනීම


	පුහුණු පාඨමාලාව	2022 වසරේ බඳවා ගත් සංඛ්‍යාව	2023 වසරේ බඳවා ගත් සංඛ්‍යාව
01	මූලික රත්න විද්‍යාව	147	229
02	රත්න විද්‍යාව	148	240
03	දෙමුහුන් රත්න විද්‍යාව	22	22
04	මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අළෙවිකරණය	24	23
05	ගෙවුඩනාප පිරියම් කිරීම	102	212
06	මැණික් කැටයම් කැපීම	07	-
07	මැණික් කැපීම සහ ඔප දැමීම NVQ 3 / NVQ 4	235	429
08	මැණික් කැපීම සහ ඔප දැමීම දින 10	8	18
09	මැණික් මිල තක්සේරුකරණය හා අළෙවිකරණය	-	36
10	ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	69	80
11	පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	17	57
12	ස්වර්ණාභරණ නිෂ්පාදනය NVQ 4	25	138
13	විලාසිතා ආභරණ නිෂ්පාදනය	15	-
14	ආභරණ සඳහා ගල් බැඳීම	30	38
15	වාත්තුකරණය සහ විද්‍යුත් ලෝහාලේපනය	-	10
16	රත්න විද්‍යා ඩිප්ලෝමාව	13	23
17	ස්වර්ණාභරණ ඩිප්ලෝමාව	-	13
18	කෙටි කාලීන පාඨමාලා	07	09
	මුළු එකතුව	**869**	**1577**

5.1.2. පසුගිය වසර පහක ශිෂ්‍ය බඳවා ගැනීමේ සංඛ්‍යාත්මක ප්‍රගතිය



වර්ෂය	ශිෂ්‍ය බඳවා ගැනීමේ ප්‍රගතිය
2019	**1165**
2020	**465**
2021	**286**
2022	**869**
2023	**1577**

5.1.3. පුහුණුව අවසන් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය



	2022	2023
පුහුණුව අවසන් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව	558	1092

5.1.4. ආදායම් ඉපයීම් වර්ධනය

මෙම වසරේදී පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම තුලින් ආයතනය මෙතෙක් ලැබූ ඉහලම ආදායම ඉපයීමට හැකියාව ලැබී ඇති අතර එය රුපියල් මිලියන 30.4 කි. මෙයට අමතරව පුහුණු අංශය මගින් මුද්‍රණය කරන ලද පාඨමාලා ආධාරක ග්‍රන්ථ අළෙවිකිරීම හරහා ද ආදායම් උත්පාදනය කර දීමට මෙම වසරේ කටයුතු කර ඇත.


අළෙවිකරනු ලබන අංශය මගින් මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ

රත්න විද්‍යාව


ගෙවුඩතාප පිරියම් කිරීම


මැණික් කැපීම සහ ඔප දැමීම

ස්වර්ණාභරණ නිෂ්පාදනය









වර්ෂය	ආදායම රු මි
2019	13.17
2020	12.82
2021	3.74
2022	16.3
2023	30.4

5.1.5. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල විශේෂ තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වයෙන් යුතුව රත්නපුර ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථානයේ දී ආයතනයේ ***ව්‍යාවසාය සංවර්ධන මාර්ගෝපදේශණ වැඩමුළු*** දෙකක් ක්‍රියාත්ම කිරීමට කටයුතු කරනු ලැබුණු අතර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ආශ්‍රිතව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් බිහි කිරීමට මෙමගින් අපේක්ෂා කරනු ලැබිණි.

- ශ්‍රී ලංකා සමුපකාර මණ්ඩලයේ නිළධාරීන් සඳහා ***රන් ප්‍රමාණය නිශ්චය කිරීම හා ස්වර්ණාභරණ තක්සේරුකරණය*** පිළිබඳව විධිමත් තාක්ෂණික න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබා දීම සඳහා එක් දින පුහුණු වැඩමුළුවක් ක්‍රියාත්මක කිරීමට ද 2023 වසරේ කටයුතු කර ඇති අතර මේ සඳහා අදාල ක්ෂේත්‍රයට අයත් නිළධාරීන් 30 ක් සහභාගි විය.

5.2. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සමකාලීන අවශ්‍යතාවයන්ට අදාල වැඩසටහන් හා පාඨමාලා සැළසුම් කිරීම

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය පිළිබඳව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අංශය විසින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් නිරන්තරව යාවත්කාලීක වන ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් පුහුණු පාඨමාලා සැළසුම් කිරීම හා සමාලෝචනය කර ඇත. ඒ අනුව හඳුනා ගත් කාලීන අවශ්‍යතා පදනම් කර ගෙන 2023 අධ්‍යයන වර්ෂය තුලදී අංශය විසින් පහත සඳහන් පුහුණු වැඩසටහන් පැවැත්වීමටත් පාඨමාල විෂයය නිර්දේශ සංවර්ධනය කිරීමටත් කටයුතු කරන ලදි.

5.2.1. මැණික් පතල් කැණීමේ තාක්ෂණික ක්‍රමවේද පුහුණු පාඨමාලාව සැළසුම් කිරීම.

ශ්‍රී ලංකාවේ පතල් කර්මාන්තයේ වර්තමානය වනතුරුම සිදුකරනුයේ පාරම්පරික දැනුම හා අවිධිමත් ඉගෙනීම හරහාය. මේ හේතුව නිසා මෙරට සිදු කරන පතල් කැණීම් සඳහා විධිමත් න්‍යායික ක්‍රියාවලින්ට හා විද්‍යානුකූල දැනුම සහිත වෘත්තියවේදීන් කර්මාන්තයට හඳුන්වා දීම සඳහා මෙම පාඨමාලාව සැළසුම් කරනු ලැබිණි. මෙම පාඨමාලාව 2024 වසරේ සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

5.2.2. මැණික් තක්සේරුකරණය හා අළෙවිකරණය පාඨමාලාව

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සුවිශේෂී විෂයයක් වනුයේ මැණික් තක්සේරුකරණය හා අළෙවිකරණය විෂයය ක්ෂේත්‍රයයි. ජාත්‍යන්තර වෙළඳපොළ කේන්ද්‍ර කරගෙන විධිමත් දැනුමකින් යුතුව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නිරතවීමට හැකි පිරිසක් ඇති කිරීම සඳහා මෙම පාඨමාලාව ආරම්භ කරන ලදි. මෙම පාඨමාලාව සැළසුම් කර විෂය මාලා සංවර්ධනය කරමින් 2023 වසරේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබිණි.

5.2.3. ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ 4) ලබා ගැනීම

අප ආයතනය විසින් තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාව සමග කරන ලද වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් පළමු වරට මෙම විෂයය ක්ෂේත්‍රය රැකියාපාදක ක්ෂේත්‍රයක් බවට හඳුනා ගැනීමට කටයුතු කල අතර ඒ අනුව ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය පාඨමාලාව සඳහා ජාතික වෘත්තිය නිපුණතා සම්මත NVQ 4 මට්ටමට ප්‍රතිනතය කර ගැනීමට කටයුතු කරන ලදි.

5.2.4. රත්න විද්‍යාව පාඨමාලාව සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ 4) ලබා ගැනීම.

රත්න විද්‍යාව විෂය ක්ෂේත්‍රය සඳහා ද ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම හිමිව නොතිබූ අතර අප ආයතනය හා තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව හා ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය සහයෝගිතාවයෙන් රත්න විද්‍යා විෂයය ක්ෂේත්‍රය සඳහා ද ජාතික වෘත්තිය සුදුසුකම් NVQ 4 මට්ටම ලබා ගැනිමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදි. මේ වන විට එහි අවසාන අදියර ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය යටතේ ඇගයිමට ලක්වේ. මෙම පාඨමාලාවද NVQ 4 සුදුසුකම සහිතව 2025 වසරේ සිට ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවති.


5.2.5. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල විද්‍යාවේදී උපාධි සුදුසුකම පිරිනැමීමට කටයුතු කිරීම

දේශීය හා ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල නිෂ්පාදන වෙළඳපොළ සඳහා උසස් දැනුමකින් යුතු වෘත්තියවේදීන් හදුන්වා දීම සඳහා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වී මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල උපාධිධාරීන් බිහි කිරීම සඳහා අවශ්‍ය විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීමට මෙම වසරේදී කටයුතු කරනු ලැබිණි. මෙහිදී හදුනා ගත් පරිදි ප්‍රථමව කර්මාන්තයට අදාල ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා සූදුසුකම ලබා ගැනීමටත් ඉන් අනතුරුව උපාධි සුදුසුකම පිරිනැමීමටත් හැකි ආකාරයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීමට සැළසුම් ගතව ඇත. 2025 / 2026 වසරේදී මෙම ඉලක්කය සම්පූර්ණ කර ගැනීමට ආයතනය සැළසුම් කර ඇත.

5.2.6. ජාතික වෘත්තීය පරීක්ෂණය හා ජාතික වෘත්තිය සුදුසුකම පිරිනැමීමේ පහසුකම් සැලසීම

වෘත්තීය පරීක්ෂණ පවත්වා අදාල නිපුණතා ඇති ශිල්පීන් සඳහා අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතික නිකුත් කිරීම මේ යටතේ සිදුවේ. අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තිය සහතිකයක් ලබා ගැනීම මගින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවනට යොමු වීම සඳහා මෙම ක්‍රමය වඩාත් යෝග්‍ය වේ. එබැවින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව අවිධිමත් පුහුණුව සහිත පිරිස් සඳහා නිවරදි වෘත්තිය පුහුණුව ලබා දීම සඳහා පෙර ප්‍රවීණතා සහතික (RPL) පිරිනැමීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා 2023 වසරේදී පූර්ණාංශය කටයුතු කරනු ලැබිණි. මේ සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර මෙමගින් ආයතනයේ ආදායම් දියුණු කර ගැනීමේ හැකියාව ද සැලසෙනු ඇත.

5.3. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය දිප ව්‍යාප්ත කිරීම.



5.3.1. පුහුණු මධ්‍යස්ථාන ක්‍රියාකාරිත්වය

2023 වර්ෂය වන විට දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව

11 කි. මෙම මධ්‍යස්ථාන හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල පුහුණු පාඨමාලා ක්‍රියාක්මක කරනු ලැබිණි . ඒ යටතේ කොළඹ ප්‍රධාන කාර්යාලය ලෙස පවත්වා ගනිමින් රත්නපුර ප්‍රධාන ප්‍රාදේශිය මධ්‍යස්ථානය ලෙසත් එයට අමතරව මහනුවර , ගාල්ල , නාඋල , යාපනය , මඩකලපුව , නිවිතිගල , අත්තනගල්ල , සේනපුර , රත්නපුර තරුණසේවා සභා කාර්යාලය යන ප්‍රාදේශිය පුහුණු මධ්‍යස්ථාන 11 ක්‍රියාත්මක විය.

5.3.2. 2023 දි ආරම්භ කරන ලද නව මධ්‍යස්ථාන



මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල පුහුණු පාඨමාලා දිප ව්‍යාප්ත කරමින් කර්මාන්තයේ නිරත පිරිස ක්‍රමිකව වර්ධනය කිරීම සඳහා 2023 වසරේ දි නව මධ්‍යස්ථාන හතරක් අලුතින් ආරම්භ කිරීමට කටයුතු කරන ලදි. අලුතින් ආරම්භ කරන ලද මධ්‍යස්ථාන වනුයේ මරදාන තාක්ෂණ විද්‍යාල පරිශ්‍රයේ ආරම්භ කරන ලද මධ්‍යස්ථානය , බදුල්ල , ගම්පොළ , හා ලග්ගල ප්‍රදේශයන්හි ආරම්භ කරන ලද මධ්‍යස්ථානයි. ඒ අනුව මේ වන විට සමස්ත පුහුණු මධ්‍යස්ථාන 15 ක් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල පුහුණු පාඨමාලා හා අනිකුත් තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

5.4. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ කාර්යයට ආයතනික ධාරිතාවයන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන අතර මෙම වසරේ දී ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කරනු ලබිණි.

5.4.1. පුහුණු අංශය සඳහා තොරතුරු කළමණාකරණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කිරීම

පාඨමාලා සැළසුම් කිරීම , ශිෂ්‍ය බදවා ගැනීම , විභාග පැවැත්වීම හා සහතික පත්‍ර නිකුත් කිරීමේ සිට පූහුණු ලාභීන් රැකියාගත කිරීම දක්වා වූ ක්‍රියාවලිය පරිපාලනය හා මෙහෙයවීමට අදාලව කළමනාකරණ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය හඳුනා ගත් බැවින් 2023 වසරේදි කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සමග සහයෝගිතාවයෙන් යුතුව එම දෙපාර්තමේන්තුව භාවිතා කරනු ලබන කළමණාකරණ තොරතුරු පද්ධතිය ආයතනය වෙත ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරනු ලැබිණි. මෙම පද්ධතියට අනුව කටයුතු කිරීම මගින් වඩාත් කාර්යක්ෂමව පුහුණු අංශයේ කටයුතු සිදු කර ගෙනයාම අරමුණ වනු ඇත.

5.4.2. විෂයය සමගාමී අනිකුත් පොදු ක්‍රියාකරකම්



සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් පැවැත්වීම

ආයතනයේ පුහුණු පාඨමාලා හදාරනු ලබන සිසුන්ගේ හා බාහිර ප්‍රජාවගේ ආකර්ශණය ඉහල මට්ටමක පවත්වා ගැනීම සඳහා අංශය විසින් දෙවන වරටත් 2023 වසරේදි ද ඉතා ගුණාත්මක අයුරින් ඩිප්ලෝමා හා ජාතික වෘත්තිය සුදුසුකම් 4 මට්ටමට සහතික පත්‍ර ප්‍රධානෝත්සවයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබිණි. මෙහිදි ඩිප්ලෝමා සිසුන් 33 ක් හා NVQ 4 සුදුසුකම සහිත සිසුන් 77 ක් සඳහා සහතික පත්‍ර ප්‍රධානය කිරීමට කටයුතු කරන ලදි.

5.4.3. වැඩමුළු සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශණ


මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ ප්‍රදර්ශනයන් ගෙන් එකක් වනුයේ ජුවෙල්ස් ප්‍රදර්ශණයයි. 2023 වසරේදි සංවිධානය කල ජුවෙල්ස් ප්‍රදර්ශණය සඳහා ආයතනයේ ප්‍රදර්ශණ කුටියක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. මෙමගින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු පාඨමාලා පිළිබඳව බාහිර සමාජයට තොරතුරු රැගෙන යාම පහසුකරවනු ඇත.

මෙම වසරේදි අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකා කෞතුකාගාරය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වූ විද්‍යා ප්‍රදර්ශණයක් සඳහා ආයතනය සහභාගි විය.



කාර්ය සාධනය

පර්යේෂණ අංශය



6. පර්යේෂණ අංශය

6.1 ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පවතින මැණික් තැම්පතු ජාතික ආර්ථිකයට දායක කිරීම මෙන්ම 1:50,000 පරිමාණයෙන් යුත් සිතියම් සංචිතයක් සකස් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වේ. එහිදී එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අදාළ මැණික් විභව සිතියම හා තාක්ෂණික වාර්තාවක් සකස් කෙරේ.

6.1.1 නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය


හෙක්ටයාර් 11,110 කින් සමන්විත නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ගාල්ල දිස්ත්‍රික්කය තුල පිහිටයි. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ප්‍රධාන වශයෙන් ප්‍රාථමික තැන්පතු පවතී. මෙම තැන්පතු භූ විද්‍යාත්මක ව්‍යුහයන් ඔස්සේ පවතින අතර එය හොරන්ගල්ල , නියාගම දකුණ වැනි ප්‍රදේශයන් හි වලදී ඉස්මතු වී ඇත. මෙම තැන්පතු තුල වෛරොඩි (Chrysoberyl) හා පසිංගල් (Alexanderite) වැනි වටිනා මැණික් වර්ග හමුවේ.



රූපය 01 – මැණික් විභව සිතියම- නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.


මැණික් ඉල්ලමෙහි ඝනකම (අඩි 0.5- 3) හා ඉල්ලමට ඇති ගැඹුර (අඩි 10-20) ස්ථානය අනුව වෙනස් වේ. තවද පිටිගල උතුර , ගොඩාමුණ, මාර්තුපිටිය, උහන්ඹිවිට යන ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිතව ප්‍රාථමික හා අඩු ප්‍රවාහයක් සහිත මැණික් නිධි පවතින නමුත් ආර්ථිකමය වශයෙන් ලාභදායි මට්ටමින් කැණීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් අයුරින් මැණික් ඛනිජ හෙලි විය. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා සකස් කරන ලද මැණික් විභව සිතියම රූපය 1 මගින් දක්වා ඇත.

6.1.2 කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය




රූපය 02(a)

කිරිඇල්ල ප්‍රදේශයේ මැණික් තැන්පතු ප්‍රධාන වශයෙන් විපරීත සම්භවයක් (Metamorphic origin) සහිත ඒවා වේ. එසේම අවසාදිත නිධි වශයෙන් දියළු සහ අවශේෂ තැන්පතුද බහුලව හමුවේ. දියළු අවසාදිත නිධි ප්‍රධාන වශයෙන් හමුවනුයේ කළුගඟ සහ කුරු ගඟ ආශ්‍රිතවය. කුරුගම්මෝදර, දොඩම්පේ, පොහොරබාව, එල්ලාවල, එපිටවල, ඇල්ලගාව, යටිපහුව, ගලතුර, දොඩම්පේ, මුදුන්කොටුව, මාටුවාගල, පුරාණ නැදුන් විහාරස්ථානය යන ප්‍රදේශ ඉහළ මැණික් විභව ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, කොට්ඨාශය පුරාම සක්‍රිය මැණික් පතල් දක්නට ඇති අතර අඩි 10-50 දක්වා ගැඹුරු තට්ටු පතල් හරහා මෙන්ම අඩි 5-20 පමණ නොගැඹුරු පතල් වලින්ද මැණික් ලබා ගැනීම සිදු කෙරේ. මැණික් ඉල්ලම් තට්ටුවේ සාමාන්‍ය ගැඹුර සාමාන්‍යයෙන් අඩි 6 - 20 අතර වෙනස් වන අතර භූමි පරීක්ෂණ වලදී මෙතෙක් හමුවී ඇත්තේ එක් තැන්පතු ස්ථරයක් පමණි. පදියං (topaz) සහ කණක (chrysoberyl) හැර අනෙකුත් සියලුම මැණික් වර්ග මෙහි දක්නට ලැබේ. කිරිඇල්ල කොට්ඨාසය මෙතෙක් කරන ලද අධ්‍යයනයන්ට අනුව ඉහළ මැණික් විභව ප්‍රදේශයක් වන අතර බොහෝ ප්‍රදේශයන්හි දැනටමත් කැණීම් සිදුකර ඇත.




රූපය 02(b)



රූපය 02(c)

රූපය 02 (a)- මැණික් විභව සිතියම- කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
රූපය 02 (b)-එපිටවල ප්‍රදේශයේ පිහිටන මැණික් තැම්පතුවක සිරස්කඩක් (ගැඹුර මීටර් වලින් දක්වා ඇත)
රූපය 02(c)-කිරිඇල්ල ප්‍රදේශයෙන් හමුවූ කිරිංචි (Spinel),කුරුවින්ද (sapphire) සහ නිල් ඇපටයිට් (blue apatite) අන්වීක්ෂීය ඡායාරූප ලෙස



6.1.3 ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මෙම කොට්ඨාශය තුළ ක්ෂේත්‍ර ගවේෂණ 70%ක් පමණ අවසන් කර ඇත. එම ප්‍රදේශය සඳහා පිළියෙළ කරන ලද මූලික මැණික් විභව සිතියම රූපය 01 මහින් දැක්වේ. එහිදී සකස් කරන ලද මැණික් විභව සිතියම තහවුරු කර ගැනීම සඳහා අත්විදුම් සාම්පල ලබා ගන්නා ලදී. එම සාම්පල විද්‍යාගාර විශ්ලේෂණය සිදු කරමින් පවතින අතර 2024 පළමු කාර්තුව තුලදී අවසන් කිරීමට අපේක්ෂිතය.

රූපය 03 - මූලික මැණික් විභව සිතියම- ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

6.1.4 දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැණික් නිධි ගවේෂණ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර දැනට සොයාගෙන ඇති පරිදි කැලණි ගංගා ද්‍රෝණිය ආශ්‍රිතව මැණික් නිධි පවතී. යෝගම, ඇපලපිටිය, තල්දූව, උඩුවිල, මාදොල, දැහැන්වක, පනාවල සහ මානියම්ගම ඉහළ මැණික් විභවතාවක් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. ඉදිරි ක්ෂේත්‍ර ගවේෂණ මත පදනම්ව අවසන් මැණික් විභව සිතියම හා තාක්ෂණික වාර්තාව 2024 වසරේදී නිකුත් කිරීමට නියමිත වේ.




රූපය 04(a)



රූපය 04(b)



රූපය 04(c)



රූපය 04(d)

රූපය 04 (a)- සීතාවක ගඟ ආශ්‍රිතව දියළු අවසාදිත නියැදි ලබාගැනීම
රූපය 04 (b)- මානියම්ගම ප්‍රදේශයේ ප්‍රාථමික තැන්පතු පවතීදැයි බැලීම සඳහා නියැදි ලබාගැනීම
රූපය 04 (c)- තිඹිරියපොල ප්‍රදේශය ආශ්‍රිතව ගංගා පිටාර තැන්පෙන් විදුම් නියැදි ලබාගැනීම
රූපය 04 (d)- දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ක්ෂේත්‍ර ගවේෂණය සිදු කරන ලද ස්ථාන

6.1.5 අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල මූලික ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු අවසන් කරන ලදී. ඒ අනුව පිළියෙල කරන ලද මූලික මැණික් විභව සිතියම මත පදනම්ව භූ විදුම් සාම්පල ලබා ගැනීමේ ක්ෂේත්‍ර කටයුතු සිදු කරන ලදී. මේ වන විට එම සාම්පල අධ්‍යයන කටයුතු, අවසන් වාර්තාව හා මැණික් විභව සිතියම් පිළියෙල කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. කළු ගඟ, ගල තුරු ඔය, හීන් ගඟ, පස්ගං ඇල, දියළු නිධි හා පල්ලෙකඩ ප්‍රදේශයේ ප්‍රාථමික අවශේෂ මැණික් නිධි හඳුනා ගන්නා ලදී.



රූපය 05 - ක්ෂේත්‍ර කටයුතු

6.1.6 පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල භූ විදුම් සාම්පල ලබා ගැනීමේ කටයුතු අවසන් කරන ලද අතර එම දත්ත මත පදනම්ව මැණික් විභව සිතියම හා අවසන් වාර්තාව යාවත්කාලීන කරමින් පවතී.



රූපය 06 - ක්ෂේත්‍ර කටයුතු







6.2 <u>ව්‍යාපෘතිය :- මැණික් සඳහා අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම</u>

6.2.1 විදුලි උදුණ ආධාරයෙන් යං ගෙවුඩ තාප පිරියම් කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වාදීම

ගෙවුඩ අතරින් යං ගෙවුඩ තාප පිරියම් කිරීම මගින් නිල්වර්ණය ලබා ගැනීම ක්ෂේත්‍රයේ පවතින ප්‍රධානතම ගැටළුවක් වේ. මෙයට පිලියමක් ලෙස මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සතු විදුලි උදුන ආධාරයෙන් නව ක්‍රමවේදයක් සොයාගන්නා ලදි.
මෙහිදී යං ගෙවුඩ නියැදි ගෙන ඒවා කොටස් හතරකට වෙන් කර ඒවා පිළිවලින් සාමාන්‍ය ක්‍රමවේදයට, ඔක්සිජන් වායුව සමග, නයිට්‍රජන් වායුව සමග හා නයිට්‍රජන් වායුව අඛණ්ඩ සැපයුමක් සහිතව උෂ්ණත්වය 1700^{o}C උෂ්ණත්වයකදි පැය 12ක කාලයක් තාප පිරියම් කරණ ලදි.






මෙම සියළු නියැදි තාප පිරියම් කිරීමට පෙර හා පසු අවස්ථා වල වර්ණ ශ්‍රේණිගත කිරීම, UV – Vis අවශෝෂණ වර්ණාවලිය, අධෝරක්ත අවශෝෂණ වර්ණාවලිය හා රත්නවිද්‍යා අන්වීක්ෂ ඡායා රූප යන අධ්‍යනයන් සිදුකරන ලදි.
මෙහි වර්ණයන්ගේ වෙනස්වීම් පහත වගුව 1.1 සිට 1.4 මගින් දක්වා ඇත. මෙහිදී පෙනී යන්නේ උෂ්ණත්වය 1700^{o}C ක පැය 12ක කාලයක් අඛණ්ඩව නයිට්‍රජන් සැපයීම මගින් යං ගෙවුඩ වල වර්ණය සාපේක්ෂව වර්ධනය වී ඇති බවය.

Table 1.1: Heat treatment of TG Samples with normal condition in 1700 ºC for 12 hours soaking.

Samples Name	TG 41/1	TG 43/1	TG 45/1	TG 50/1
Before Heat Treatment				
After Heat Treatment				







රූපය 07- නිදර්ශක-01

Table 1.2: Heat treatment of TG Samples with filled O_2 in 1700 °C for 12 hours soaking.

Samples Name	TG 41/2	TG 43/2	TG 45/2	TG 50/2
Before Heat Treatment				
After Heat Treatment				






රූපය 07- නිදර්ශක-02

Table 1.3: Heat treatment of TG Samples with filled N_2 in 1700 °C for 12 hours soaking.

Samples Name	TG 41/3	TG 43/3	TG 45/3	TG 50/3
Before Heat Treatment				
After Heat Treatment				

රූපය 07- නිදර්ශක-03

Table 1.4**: Heat treatment of TG Samples with flowing N_2 in 1700 $^{\circ}$C for 12 hours soaking**.

Samples Name	TG 41/4	TG 43/4	TG 45/4	TG 50/4
Before Heat Treatment				
After Heat Treatment				

රූපය 07- නිදර්ශක-04

මෙහිදී ඉහල උෂ්ණත්ව වලදි නයිට්‍රජන් වායුව පරමාණු බවට පත්වන අතර ඒවා මගින් විදුලි උදුන තුල සාමාන්‍ය පීඩනයට වඩා 0.3bar පීඩනයක් ඇති කරනු ලබයි. එමගින් Ti^{2+} හා Fe^{2+} අයන වල Inter Valance Charge Transfer(IVCT) ක්‍රියාවලිය ප්‍රසස්ථ ලෙස සිදුවන බව කිව හැකිය. මේ පිළිබඳව වැඩිදුරටත් අධ්‍යනයන් Gemological Institute, China University of Geoscience හි පර්යේෂකයන් සමග එක්වී සිදුකරනු ලබයි.

6.2.2 විකිරණශීලී අප්‍රිකානු රෝස නිල් සෆයර්(Sapphire) පිළිබඳ සවිස්තරාත්මක විමර්ශනය

ප්‍රතිකිරණය (Irradiation) මගින් කුරුවින්ද මැණික් එනම් රූබි හා සෆයර් වල වර්ණය වැඩිදියුණු කිරීම කාලයක සිට සිදුකරනු ලබයි. එහෙත් මෑත කාලයේදී LMHC (Laboratory Manual Harmonization Committee) මෙලෙස පිරියම් කරන ලද රූබි හා සෆයර් නිවැරදිව හඳුනා ගැනීම පිළිබඳව සාකච්ඡාකරන ලදි (LMHC Press release, March 14, 2023). මෙයට ප්‍රධානතම හේතුව වුයේ ඉතාම සුළු පිරිසක් විසින් ආරෝග්‍ය ශාලාවල පවතින පිළිකා රෝගීන් සඳහා ප්‍රතිකාර කරන ගැමා උපකරණ භාවිතයෙන් අප්‍රිකානු රූබි හා රෝස පැහැති සෆයර් (Pink Sapphire) වල නිල් ඉවත් කිරීම සිදුකිරීම හා ඒවා ජාත්‍යන්තර මැණික් වෙළඳපොළ වෙත යොමුවීමත් නිසාවෙනි. එහෙත් මෙම පිරියම් කිරීම පිළිබඳව අධ්‍යයනයක් සිදුකර නොතිබිනි. තවද එය ජාත්‍යන්තර රත්නවිද්‍යා විද්‍යාගාර වලින් අනාවරණය කර ගැනීමටද නොහැකිවී ඇත.

එබැවින් මේ පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම ඉතා වැදගත්වේ. මේ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මැඩගස්කර නිල්/රතු නියැදි ගෙන ඒවා සකසා Horticultural crop Research and Development Institute (HORDI) හි ඇති ගැමා උපකරණ මගින් 160 KGry පරිමාණයකට සියළු නියැදි ගැමා ප්‍රතිකිරණය සිදුකරන ලදි. මෙම සියළුම නියැදි ගැමා ප්‍රතිකිරණය පෙර හා පසු අවස්ථාවල ඒවායින් පිටකරන ලද කිරණ පිලිබඳව විශ්ලේෂණයක් ජාතික පරමාණු බලශක්ති අධිකාරිය සමග සිදුකරන ලදි.

මෙම පර්යේෂණයෙන් පෙනීගිය කරුණු වනුයේ රූප සටහන 01 අනුව බොහොමයක් මැඩගස්කර් රතු වල නිල් පැහැය අඩුවි ඇති බවය. තවද මෙහි UV – Visible හා FTIR විශ්ලේෂණයන්හි සැලකිය යුතු වෙනසක් පිරියම් කිරීමෙන් පසු නිරීක්ෂණය නොවීය.

Sample No.	Appearance before Irradiation	Color of the samples before Irradiated	Appearance after Irradiation	Color of the samples after Irradiated
AS 01		Pink color		Hot Pink color
AS 02		Violet color		Peach color
AS 04		Purplish Blue		Peach mixed Blue
AS 05		Violet color		Pink color
AS 06		Blue		Peach mixed Blue
AS 07		Pink color		Hot Pink color
AS 08		Purplish Pink color		Pink color

රූපය 08- සඟයර් නිදර්ශක විශ්ලේෂණය

මෙහි වෙනස හඳුනාගත හැකි ප්‍රධානතම සාධකය වනුයේ ගැමා ප්‍රතිකිරණයට පසුව X-Ray කිරණ පිටකිරීමේ සියුම් වෙනසක් නිරීක්ෂණය වී ඇති අතර එය මෙවැනි ගල් හඳුනා ගැනීම සඳහා යොදාගත හැකිද යන්න පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරනු ලබයි.


6.2.3 කිරිංචිවල ගෙවුඩ ඉවත්කර අනර්ඝ කිරීමේ ක්‍රමවේදය සෙවීම

ශ්‍රී ලංකාවේ විවිධ කිරිංචි (Spinel) වර්ග හමුවන අතර බොහොමයක් මැණික්මය තත්වයෙන් අඩු ගල් වේ. එහෙත් මේවා සඳහා පිරියම් කිරීමේ ක්‍රමවේදයන් භාවිතය ඉතා අවම වේ. මේ අතර අඳුරු හා වර්ණයෙන් අඩු අභ්‍යන්තරයේ ගෙවුඩ සඟයර් ලෙස දිස්වන කිරිංචි හමුවේ. මේවා ගෙවුඩ කිරිංචි ලෙස හඳුන්වයි. මෙම කිරිංචි සඳහා පිරියම් කිරීමේ ක්‍රමවේදයක් සෙවීම වැදගත් වේ.

එබැවින් තෝරාගත් ගෙවුඩ කිරිංචි ගෙන ඒවායේ සමාන්තර පැති දෙකක් ඔප දමා තාප පිරියම් කිරීමට පෙර හා පසු අවස්ථාවල රත්නවිද්‍යාත්මක අන්වීක්ෂයක් අධාරයෙන් අභ්‍යන්තරයේ ඇති අපද්‍රව්‍ය ඛණිජ (Inclusions) වල ඡායා රූප ලබා ගන්නා ලදි. තවද මෙම නියැදි වල UV – Visible හා Infrared අවශෝෂණ වර්ණා වලිය තාප පිරියම් කිරීමට පෙර හා පසු අධ්‍යනය කරන ලදි.

රූපසටහන 02 ට අනුව පෙනීයන්නේ උපරිම උෂ්ණත්වය 900°C ක පැයක කාලයක් තාප පිරියම් කිරීමේදී ද අඩු ප්‍රතිශතයක් ඇති "ගෙවුඩ" දියවී ඇති බවය. තවද Raman අවශෝෂණ වර්ණාවලියේ 600 හා 800 Cm^{-1} අතර අවශේෂණයන් තාප පිරියම් කිරීමට පෙර හා පසු අවස්ථාවල වෙනසක් දක්නට ඇති බවත්ය. මෙය තාප පිරියම් කරන ලද කිරිංචි හඳුනා ගැනීම සඳහා යොදාගැනීමට හැකියාවක් පවතින බවත්ය.

තාප පිරියම් කිරීමට පෙර **තාප පිරියම් කිරීමට පසු**



රූපය 09- නිදර්ශක විශ්ලේෂණය

6.2.4 ලක්මිණි වායු උඳුන මඟින් තික් සිල්කි ගෙවුඩ වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරීම පිළිබඳව අධ්‍යයනය.


මෙම අධ්‍යයනය යටතේ පසුගිය වසර තුල ලද ප්‍රතිඵල අනුව හොඳම වර්ණය හා පැහැදිලි බව ලබා ගැනීමට හැකිවූයේ මද ඔක්සිකාරක තත්වය යටතේ තාප පිරියම්කරණය මඟිනි. නමුත් මෙහිදී තව දුරටත් වර්ණ පටි ලෙස සාන්ද්‍ර වූ කලාප සහිතව වර්ණය වැඩි දියුණු වීම (තොරවල සහිතව) වැනි අඩුපාඩු පැවති බැවින් මෙම වසර තුලදී ද විවිධ ඔක්සිකාරක තත්ව යටතේ පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. නමුත් මේ දක්වා මද ඔක්සිකාරක තත්ව යටතේ ලද ප්‍රතිඵල අභිබවායාමට හෝ පැවති දුර්වලතා මඟ හරවා ගැනීමට නොහැකි වූ බැවින් ලබන වසර සඳහාද මෙම අධ්‍යයනය දීර්ඝ කරන ලදී.

6.2.5 අඳුරු තද පැහැති කිරිංචි වල පැහැදිලි බව වැඩි කිරීම පිළිබඳව අධ්‍යයනය.

තද පැහැති කිරිංචි සාම්පල රසායනික විශ්ලේෂණයට ලක් කර විවිධ උෂ්ණත්ව හා වායු ගෝලීය තත්වය යටතේ තාප පිරියම් පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. එහිදී සැලකිය යුතු පැහැදිලි බාවයෙහි වර්ධනයක් සිදු නොවූ අතර මෙම අධ්‍යනය කටයුතුද ලබන වසර සඳහා දීර්ඝ කරන ලදී.

6.3 <u>ව්‍යාපෘතිය :- මැණික්වල වර්ණ වැඩි දියුණු කිරීම සඳහා තෙවන වායුවක (H2, N2, Ar, CO2) බලපෑම හඳුනා ගැනීම සහ විදුලි උඳුන භාවිතයෙන් ගෙවුඩ සඳහා පිරියම් කිරීමේ තත්ත්ව ස්ථාපනය කිරීම</u>

ලක්මිණි උඳුනේ ඔක්සිජන් හා L.P.G. වායුන්ට අමතරව එහි ඔක්සි හාරක තත්වය ලබා ගැනීම සඳහා තෙවන වායුන් කාලයක සිට බාවිතා කරනු ලබයි. එහෙත් අප පර්යේෂණයන්ගෙන් පෙනී ගොස් ඇත්තේ මෙය වර්ණය වැඩිදියුණු කිරීම සඳහා ඇතැම්විට අහිතකර ලෙස බලපාන බවය. එයට ප්‍රධානතම හේතුව වනුයේ මෙම තෙවන වායුව මඟින්ගෙවුඩ සීග්‍රයෙන් සිසිල් වීම වර්ණ වැඩි දියුණු කිරීමට බලපෑම් කිරීමය. එබැවින් මෙම පර්යේෂණයේ මුල් අදියරේදී දැනට භාවිතයට ගන්නා ලක්මිණි උඳුන නවීකරණය කිරීම සිදුකිරීමට සැලසුමක් නිර්මාණය කර ලංකා රිෆැක්ටරීස් ආයතනය සමග ඒකාබද්දව සිදුකරමින් පවති.



රූපය 10 - ලක්මිණි උදුන නවීකරණය කිරීම සිදුකිරීමට යෝජිත සැලසුම

6.4 <u>ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ මැණික්වල පළුදු පිරවීම සඳහා සුදුසු තෙල් වර්ගයක් හඳුනා ගැනීම</u>

මෙම ව්‍යාපෘතිය යටතේ පුෂ්පරාග (Sapphire) වල පලුදු පිරවීම අධ්‍යයනය සිදු කරන ලදි. එහිදී කපා ඔපදමන ලද පුෂ්පරාග වල පිටතින් විවර වී ඇති පලුදු පිරවීම සඳහා ග්ලිසරින් යොදා ගත හැකි බව අධ්‍යයනය කරන ලදී.



රූපය 11 - පළුදු පිරවීම සඳහා සුදුසු තෙල් වර්ගයක් හඳුනා ගැනීමට පර්යේෂණ සිදු කිරීම

6.5 <u>ව්‍යාපෘතිය :- නැනෝ තාක්ෂණය යොදා ගනිමින් වර්ණවත් රත්නන් මිශ්‍ර ලෝහයක් සෑදීම</u>

මෙම ව්‍යාපෘතිය යටතේ නැනෝ තාක්ෂණය මඟින් වර්ණවත් රත්නන් අංශු නිෂ්පාදනය පිළිබඳ මූලික අධ්‍යයනය සිදු කර රතු පැහැති රත්නන් අංශු නිෂ්පාදනය සිදු කරන ලදී.



රූපය 12 - වර්ණවත් රත්නන් මිශ්‍ර ලෝහයක් සෑදීම සඳහා පර්යේෂණ සිදු කිරීම

6.6 <u>ව්‍යාපෘතිය :- ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික ස්වර්ණාභරණ මෝස්තර පිළිබඳ නාමාවලියක් සකස් කිරීම</u>

ශ්‍රී ලාංකික ඉතිහාසය තුළ හමුවන බොහෝ කලා නිර්මාණ අතරින් ශ්‍රී ලාංකික පාරම්පරික ආභරණ විශේෂ ස්ථානයක් හිමි කර ගනී. මෙම ආභරණයන්හි දක්නට ඇති සුවිශේෂී පාරම්පරික මෝස්තර සංරක්ෂණය කරමින් ඒවා ආශ්‍රිතව නව නිර්මාණ හඳුනාගැනීම හා ඒවා ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කිරීමේ අරමුණින් සවිස්තරාත්මක නාමාවලියක් (Catalogue) සකස් කිරීම, ආයතනයේ 2023-2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර මේ වන විට සිදුකරගෙන යයි.

මේ පිළිබඳ සුදුසු මූලාශ්‍ර ලෙස ඓතිහාසික යුගයේ සිට ශ්‍රී ලංකාවට උරුම වූ පාරම්පරික ආභරණ මෝස්තර ප්‍රධාන වශයෙන් සංරක්ෂණය වී ඇත්තේ ජාතික කෞතුකාගාර තුළ බව හඳුනාගන්නා ලදී. ඒ අනුව එම පාරම්පරික ආභරණ මෝස්තර පිටපත් කිරීම හා ඡායාරූපගත කිරීම සඳහා ජාතික

කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම මෙන්ම ඔවුන්ගේ දැනුම, කුසලතා, අත්දැකීම්, තාක්ෂණය, මානව සහ භෞතික සම්පත් බෙදාහදා ගනිමින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අප ආයතනය හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම සඳහා අවශ්‍ය කටයුතු ද සම්පාදනය කර ඇත. එසේම මේ වන විට කොළඹ ජාතික කෞතුකාගාරය ආශ්‍රිතව ඇති ආභරණ මෝස්තර පිටපත් කිරීමේ කටයුතු සිදුකෙරේ.



රූපය 13 - කොළඹ ජාතික කෞතුකාගාරය ආශ්‍රිතව පිටපත් කරන ලද ආභරණ මෝස්තර කිහිපයක්

6.7 <u>ව්‍යාපෘතිය :- රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම.</u>

ISO 17025:2017 විද්‍යාගාර ප්‍රතිනතය යටතේ ආයතනික විද්‍යාගාර ප්‍රතිනතය ආරම්භ කර ඇත. මෙහිදී කාර්මික තාක්ෂණික ආයතනයේ උපදේශකත්වය යටතේ අදාල කටයුතු කරමින් පවතී. රසායනාගාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ සම්පූර්ණ ක්‍රියාවලිය 2024 තුල දී දී අවසන් කෙරේ.

6.8 <u>ව්‍යාපෘතිය :- ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම.</u>

6.8.1 “Sri Lankan Gem Mining Industry for Sustainable Era” නම් වූ ග්‍රන්ථය සම්පාදනය කිරීම


